**ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොළඹ දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බව,

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1** **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

**පුනරාවර්තන වියදම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික් ලේකම්වරයාගේ අංක DIST.CMB/AD/3/11/2017 හා 2020 සැප්තැම්බර් 09 දිනැති ලිපිය මගින් නිල මැදුර ගොඩනැගිල්ලේ ස්ථාපිත රාජ්‍ය ආයතන විසින් භාවිතා කරන මහල් සංඛ්‍යාව අනුව ප්‍රතිශතාත්මකව විදුලි බිල අයකර ගැනීමට අවශ්‍ය උපදෙස් හා නිර්දේශ ලබා දී තිබුණි. ඒ අනුව වාර්ෂික විදුලි බිල් ගාස්තුව වන රු.47,288,060 න් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විය යුත්තේ සියයට 32 ක ප්‍රමාණයක් එනම් රු.15,132,179 ක් පමණි. එහෙත් 2020 වර්ෂය සඳහා විදුලි වියදම් ලෙස ගිණුම්ගත කර ඇති වටිනාකම රු.46,427,926 ක් බවත් ඒ අනුව විදුලි ගාස්තු වියදමට වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු බවත් නිරීක්ෂණය විය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල "නිලමැදුර" ගොඩනැගිල්ල මහල් 19 කින් සමන්විත අතර, සම්පූර්ණ ගොඩනැගිල්ල වෙනුවෙන්ම ලැබෙන්නේ එක් විදුලි බිල්පතකි. එසේම තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය (මහල් 04ක් සඳහා) දිස්ත්‍රික් ලේකම් යටතේ පවතින ආයතනයක් බැවින් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් විදුලිය හා ජලය (255-01-02-00-1403) වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් නොකරන අතරම, දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය විදුලිය හා ජලය වැය විෂයෙන්ම (255-01-01-00-1403) තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලට අදාල සියයට 21 ප්‍රතිශතය වියදම දරනු ලබයි. එසේම සම්පූර්ණ බිල්පතින්, මැතිවරණ දෙපාර්තමේන්තු කාර්යාලයට අදාල එක් මහලක් වෙනුවෙන් සියයට 05ක ප්‍රතිශතයක් හා අභ්‍යන්තර ආරක්ෂක ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයට අදාල මහල් 08 වෙනුවෙන් සියයට 42 ක ප්‍රතිශතයක් වෙන්වෙන්ව අයකරගෙන ඇති බව. | වියදම් ගිණුම් තැබීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අදාළ වියදම නිවැරදිව ප්‍රතිශතාත්මකව ගණනය කර ගිණුම් තැබිය යුතු වීම. |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර වත්කම් ගිණුම් ප්‍රකාශය (**SA - 82**) අනුව මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු.8,430,256,825ක් වුවද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එම ශේෂය රු.8,430,427,962ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිහිපයක රු.171,137 ක් වටිනා මූල්‍ය නොවන වත්කම්, භාණ්ඩාගාර වත්කම් ගිණුම් ප්‍රකාශයට ඇතුළත් නොකිරීම මේ සඳහා හේතු වූ බව හඳුනාගෙන තිබුණි. | මෙම වෙනස්කම් හඳුනාගෙන ඇති අතර 2020 භාණ්ඩාගාර ගිණුම් වාර්තාව නිවැරදි කර ගැනීමට කාලය ප්‍රමාණවත් නොවූ නිසා මෙලෙස වෙනස්කම් තිබෙන බවත්, එකී වෙනස් කම් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව | මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රථම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළ සියළු තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් කඳවිය යුතු වීම. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට පැවති එකතු වටිනාකම රු.8,149,483,260 ක් වූ මූල්‍ය නොවන වත්කම්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ඒසීඒ-6) 2020 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන එනු වෙනුවට, එම දිනට සටහන් කර තිබුණු ආරම්භක ශේෂය රු.3,514,457,904 ක් විය. මේ අනුව පූර්ව වර්ෂයේ අවසන් ශේෂය, සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය වශයෙන් ඉදිරියට ගෙන ඒමේදී රු.4,635,025,356 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණු අතර එය අවසාන ශේෂයටද බලපා තිබුණු බව නිරීක්ෂණය විය. | දේපල පිරියත උපකරණ ශේෂයට අදාල, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශේෂය සහ භාණ්ඩාගාර ගිණුම් වාර්තාවේ ශේෂය අතර වෙනසක් පැවතීම සිගාස් වැඩසටහනේ ආරම්භක ශේෂ ඇතුළත් කිරීමට ලබා දී ඇති උපදෙස් අනුව කටයුතු කිරීම මත සිදුවන්නක් බවද එය නිවැරදි කිරීම සඳහා සිගාස් වැඩසටහනේ ප්‍රවර්තන වර්ෂයේ ආරම්භක ශේෂ සටහන් කිරීම සඳහා වෙනම තීරුවක් ඇතුළත් කිරීම මඟින් සිදු කල යුතු අතර, එය රාජ්‍ය ගිණුම දෙපාර්තමේන්තුව විසින් සිගාස් වැඩසටහන යාවත්කාලීන කිරීම තුලින් සිදු කළ යුතු, අපගේ පාලනයෙන් ඔබ්බට ගිය කටයුත්තක් බව | මූල්‍ය නොවන වත්කම් වටිනාකම්වල ආරම්භක ශේෂ නිවැරදිව ඉදිරියට ගෙන ආ යුතු වීම. |

**1.6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.208,611,369 ක්වූ අතර භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.209,560,063 ක් විය. මෙයට හේතු වී තිබුණේ 2013 වර්ෂයේ සිට වර්ෂ 08 ක කාලයක් ඉකුත් වී තිබුණද නිරවුල් කර නොතිබුණු රු.1,150,694 ක් වූ නොසැසඳුණු හර ශේෂයක් සහ සමාලෝචිත වර්ෂයේදී රු.202,000 ක් වූ වැරදි බැර ශේෂයක් පැවතීම බව නිරීක්ෂණය විය. | රු.1,150,694ක් වූ නොසැසඳුණු හර ශේෂය සම්බන්ධයෙන් පත්කරන ලද කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අදාල වාර්තාවන් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙතද රජයේ ගිණුම් කාරක සභාව වෙතද යොමු කර ඇති අතර මෙම සිද්ධියට වගකිවයුතු දැනට රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව සහ වැය ශීර්ෂයට කරන ලද රු.202,000 වැරදි බැර කිරීම 2021 මාර්තු මස භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශ මගින් නිවැරදි කර ඇති බව. | භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අනුව වෙනසට අදාල සැසඳුම් නොකළ ශේෂය කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2020 හි 3.4 ඡේදය අනුව, සහතික කරනු ලැබූ අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශයේ තොරතුරු අනුව පමණක් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු බව විශේෂයෙන් අවධාරණය කර ඇත. ඒ අනුව භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශය **(SA- 50)** අනුව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ලැබීම් රු.57,766,931ක් හා එම අත්තිකාරම් ගෙවීම් රු.71,823,577ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය පිළිවෙලින් රු.41,483,888ක් හා රු.71,277,334ක් වශයෙන් දක්වා තිබුණි. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.10,048,229,796 ක් විය යුතු වුවද සාවද්‍ය දත්ත ගිණුම්ගත කිරීම හේතුවෙන් අග්‍රිම ශේෂය රු.10,032,492,996 ක් ලෙස දක්වා තිබුණි. | ප්‍රමාද දෝෂයක් හේතුවෙන් අක්මුදල් ගැලපුම් ගිණුමට අත්තිකාරම් ලැබීම් ගිණුමේ වෙනස වු රු.16,283,043.76 හා අත්තිකාරම් ගෙවීම් ගිණුමේ වෙනස වු රු.546,243 ක මුදල ඇතුළත්ව අක්මුදල් ගැලපුම් ගිණුම සකස් කර තිබුණ අතර, ඔබ විසින් පෙන්වා දී ඇති ආකාරයට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් භාණ්ඩාගාර මුද්‍රිත අනුව ලැබීම් රු.57,766,931ක් ලෙසද ගෙවීම් රු.71,823,577ක් ලෙසද සටහන් කළ විට 2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.10,048,229,797 ක් ලෙස වෙනස් වන බව. එ් අනුව, අක් මුදල් ගැලපුම් ගිණුමට අත්තිකාරම් ලැබීම් ගිණුමේ වෙනස වු රු.16,283,043.76 හා අත්තිකාරම් ගෙවීම් ගිණුමේ වෙනස වු රු.546,243 ක මුදල ගලපා සකස් කළ අක්මුදල් ගැලපුම් ගිණුම ශේෂය රු.10,048,229,797 ලෙස වෙනස් වන බව. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

## 1.6.4 තැන්පතු ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාණ්ඩාගාර ප්‍රකාශය (SA - 30) අනුව තැන්පතු ගිණුම් ශේෂය රු.702,411,998 ක් වුවද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එය රු.712,411,998ක් ලෙස දක්වා තිබුණි. මෙම වෙනස සඳහා තැන්පත් ගිණුමේ තිබෙන රු.10,000,000 ක් වූ නිරවුල් නොකරන ලද හර ශේෂය හේතු වී තිබුණි. | භාණ්ඩාගාර ප්‍රකාශ අනුව හා දි.ලේ.කාර්යාලයීය පොත් අනුව තැන්පතු ශේෂය අතර පවතින වෙනස රු.10,000,000ක් වන අතර , තැන්පත් ගිණුමේ පවතින එම වෙනස සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලැබෙන උපදෙස් අනුව කටයුතු කරන බව. | මෙම හර ශේෂය නිරවුල් කර එම වෙනස තැන්පතු ගිණුම්වලින් ඉවත්කිරිමට කටයුතු කළ යුතු වීම. |

## 1.6.5 අක්මුදල් ගැලපුම් ගිණුම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් දෙපාර්තමේන්තු පොත් අනුව පිළිවෙලින් රු.91,327,949 ක් හා රු.106,730,345ක් ද භාණ්ඩාගාර ප්‍රකාශය (SA - 82) අනුව ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.57,766,931 ක් හා 71,823,577ක්ද විය. ඒ අනුව දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර ප්‍රකාශය (SA - 82) අනුව වෙනස වූ රු.34,906,768 ක් හා රු.33,561,018ක් අක්මුදල් ගැලපුම් ගිණුමට ගැලපීම වෙනුවට රු.35,453,011 ක් හා රු.29,844,062 ක් ලෙස ගලපා තිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2020 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ මාර්ගෝපදේශ අනුව අක්මුදල් ගැලපුම් ගිණුම සකස් කර ඇති අතර, එම ගිණුම පිළියෙල කිරීමේ දී දෙපාර්තමේන්තු පොත්වලින් සිගාස් වැඩසටහන හරහා ගිණුම්ගත නොවන, නමුත් භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශයේ වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු විසින් කරනු ලබන හර හා බැර සටහන් ඇතුළත් කර ඇති බව. | අක්මුදල් ගැලපුම් ගිණුම නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විදුලිය හා ජලය පුනරාවර්තන වැය විෂයය සඳහා ප්‍රතිපාදන ඉක්මවා රු.1,698,456 ක බැරකම්වලට එළඹ තිබුණි. | එකඟ වෙමි. 2020 වර්ෂයේ අතුරු සම්මත ගිණුම් මගින් ප්‍රතිපාදන ලැබුණු අතර, 255-1-1-0-1403 දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය විදුලිය හා ජලය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණයේ ස්ථාපිත අනිකුත් අංශ වෙතින් නියමිත දිනයන්හි 1403 සඳහා ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් මෙලෙස ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළඹීමට සිදු වූ බව. | මුදල් රෙගුලාසි 94 හි විධිවිධාන ප්‍රකාරව වැය විෂයන්වල වාර්ෂික ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීමට කටයුතු නොකළ යුතු වීම |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10.1 ඡේදයෙහි දක්වා ඇති ආකාරයට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 06 හි 3.4 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ (සටහන **iii**) දැක්වෙන බැරකම් භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් විෂයයන්ට අදාළව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශයේ (**SA-**92) බැරකම් ශේෂය සමග සැසඳී තිබිය යුතුය. නමුත් මූල්‍ය ප්‍රකාශනවල සටහන **(iii)** අනුව බැරකම් ශේෂය රු.6,414,969ක් හා භාණ්ඩාගාරය ප්‍රකාශය (**SA-**92) අනුව රු.1,043,453 ක් වූයෙන් රු.5,371,516 ක වෙනසක් නිරීක්ෂණය විය | මෙම බැරකම් ශේෂයේ ද වැඩිම වටිනාකමක් ඇතුළත්ව ඇති විදුලිය හා ජලය වැය විෂයේ ප්‍රතිපාදන ඉක්මවා යාම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී තිබෙන බව. මෙයට හේතුව 1403 විදුලිය වැය විෂය සඳහා 2020 අතුරු සම්මත ගිණුම මගින් ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන නොලැබීම හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණයේ ස්ථාපිත අනිකුත් අංශ වෙතින් නියමිත දිනයන්හිදී ප්‍රතිපාදන නොලැබීම. | භාණ්ඩාගාරය පොත් හා දෙපාර්තමේන්තු පොත් අනුව වෙනස හඳුනාගෙන අදාල නිවැරදිකිරීම් කළ යුතු වීම. |

## 2.2 තැන්පතු

---------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) පොදු තැන්පත් (පැරණි) ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට රු.10,000,000 ක් වූ හර ශේෂය සඳහා වර්ෂ 13 කට අධික කාලයක් ඉකුත් වී තිබුණද, 2019 ඔක්තෝබර් 15 දිනැති හා අංක 269/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.7 ඡේදයේ විධිවිධාන ප්‍රකාර පියවා නිරවුල් කිරීමට නොහැකි වී තිබුණි. | පොදු තැන්පත් ගිණුමේ පවතින රු.මිලි. 10 හර ශේෂය මු.රෙ.109 ප්‍රකාරව, පොතෙන් කපා හැරීමට අදාල පොදු 285 පෝරම නිසි පරිදි සකස් කර ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත 2020 නොවැම්බර් 16 දින යවන ලද අතර, අමාත්‍යාංශය මගින් අදාල පෝරම කට්ටලය 2020 නොවැම්බර් 24 දින අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යවා ඇති අතරම, 2021 මැයි 04 දාතමින් මේ සම්බන්ධයෙන් සිහිකැඳවීම් ලිපියක්ද යොමු කර ඇති බවද ඒ අනුව අපගේ පාලනය යටතේ, මේ සම්බන්ධයෙන් ගතහැකි ක්‍රියාමාර්ග සියල්ල සිදු කර ඇති බව. | මෙම හර ශේෂය නිරවුල් කර ගැනීමට චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර කටයුතු කළ යුතු වීම. |
| (ආ) වන්දි ගෙවීම් තැන්පතු ගිණුමේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 11 කට අදාළව වර්ෂ 05 ක් හෝ ඊට වැඩි කාලයක් කල් ඉකුත් වූ තැන්පතු වටිනාකම රු.104,054,293 ක් විය. වන්දි ගෙවීමට පෙර, තිබෙන ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා වන මූලික කටයුතු කඩිනමින් නිම කර ඉඩම් වන්දි ගෙවා එම තැන්පතු ශේෂ නිරවුල් කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම සියළු වන්දි තැන්පතු, ඉඩම් වන්දි තැන්පතු වන අතර කොලොන්නාව - රු.5,778,768 ක වන්දි තැන්පතුව සම්බන්ධයෙන් නඩු කටයුත්තක් පවතින බවද, රත්මලාන - රු.8,163,249 ක හා හෝමාගම - රු.2,414,884.15 ක වන්දි තැන්පතු සම්බන්ධයෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් නොවී පවතින බවද, ශ්‍රී ජයවර්ධනපුර රු.16,180,989 ක වන්දි තැන්පතුව සම්බන්ධයෙන් තක්සේරු වාර්තා නොලැබීම මත තවදුරටත් එම තැන්පතු රඳවා ගෙන ඇති බවද, එම ශේෂයන් හැර ඉතිරි සියළුම වන්දි තැන්පතු ශේෂයන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බවද, මු.රෙ.571 ප්‍රකාරව, ඉඩම් වන්දි වසර 10 උපරිම කාලයකට යටත්ව රඳවා ගැනීමට හැකියාව ඇතත්, මෙම කිසිදු තැන්පතුවක් වසර 10 ඉක්මවා නොමැති බවද දන්වමි. | තැන්පතු නිදහස් කිරීම සඳහා පවතින ගැටළු කඩිනමින් විසඳාගෙන මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව නිරවුල් නොවූ තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 570(අ) අනුව ඉඩම් වන්දි තැන්පත් කළ දින සිට වර්ෂ 10 ක් ගතවූ පසු ඉකුත් තැන්පත් ලෙස රජයේ ආදායමට බැර කළ යුතු වුවද තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව තැන්පතු 11 ක රු.3,962,668 ක් පැවති අතර 2021 මාර්තු 31 දින වන විටත් එම ශේෂය නිරවුල් කිරීමට අදාල පියවර ගෙන නොතිබුණි. | ඉඩම් තැන්පතු 11 සම්බන්ධයෙන් මේවන විට අදාල ආයතනවලින්, ව්‍යාපෘති ප්‍රගතිය විමසා ඇති අතර ඒ අනුව එම තැන්පතුද ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කිරීමට ප්‍රා.ලේ. තිඹිරිගස්යාය වෙත උපදෙස් ලබාදුන් බව. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව නිරවුල් නොවූ තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් නිලමැදුර ගොඩනැගිල්ලෙහි එම අමාත්‍යාංශය විසින් භාවිතා කරන මහල් සඳහා 2020 ජනවාරි සිට නොවැම්බර් දක්වා විදුලිය හා ජල බිල්පත් වියදම් ප්‍රතිපූරණය වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දිනැතිව රු.9,137,610 ක් දිස්ත්‍රික් ලේකම්වරයා වෙත ලබා දී තිබුණි. එම මුදල වියදම් ප්‍රතිපූර්ණය සඳහා අරමුදල් ලැබීම් තැන්පත් ගිණුමට බැර කර තිබුණද 2021 මාර්තු 24 දින වන විටත් 2020 වර්ෂයේ විදුලි වියදම් ගිණුමට අයකර නොතිබුණෙන් පොදු තැන්පත් ගිණුම් ශේෂයක් ලෙස දක්නට ලැබුණි. | ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් නිල මැදුර ගොඩනැගිල්ලෙහි, අමාත්‍යාංශයට අයත් මහල් සඳහා විදුලි හා ජල බිල්පත් වෙනුවෙන් රු.9,137,609.80ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත 2020 දෙසැම්බර් 31 වන දින ලබාදී තිබූ අතර එය වියදම් ප්‍රතිපූර්ණ ගිණුමට (6000-00-00-20-00-06) බැර කළ බවත් මේ වනතුරු විදුලිය හා ජලය සඳහා ගෙවීම් කිරීමට ප්‍රමාණවත් මුදල් හා ප්‍රතිපාදන තිබූ හෙයින් අමාත්‍යාංශයෙන් ලද භාවිතයට නොගත් මුදල ඉදිරි මාසික බිල්පත් පියවීම සඳහා ප්‍රයෝජනයට ගන්නා බව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව වාර්තාකරන කාලපරිච්ඡේදයට අදාල වියදම නිවරදිව මූල්‍ය ප්‍රකාශනවලින් පිළිඹිබු විය යුතු බැවින් සමාලෝචිත වර්ෂයේ වියදම් පියවීම සඳහා ලැබුණු මුදල එම කාර්යය වෙනුවෙන් යෙදවිය යුතු වීම. |

## 2.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සේවා ස්ථාන මාරු වීම, මිය යාම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම සහ සේවය හැර යාම යනාදී හේතූන් මත දැනට සේවයේ නොමැති නිලධාරීන් හා සේවකයන් 20 දෙනෙකුගෙන් අයකර ගත යුතු හිඟහිටි ණය ශේෂ එකතුව රු.1,389,130 ක් 2021 අප්‍රේල් 30 දින වනවිට පැවති අතර එම ශේෂ වර්ෂ 2 ක් හෝ ඊට වැඩි කාලයක සිට අය විය යුතුව පැවතුණි. | හිඟහිටි ශේෂය අය කර ගැනීමේ ප්‍රධාන බාධකය වන්නේ, අදාල ණයකරු වෙනුවෙන් ඇපයක්/ඇපකරුවෙකු නොමැතිවීමයි. වසර 10ක් සම්පූර්ණ රාජ්‍ය සේවකයින්ට ඇප රහිතව ණය ලබාදීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය මත මෙවැනි තත්වයක් ඇතිවී ඇත.<br>ඊට පරිබාහිර හේතු නිසා ඇති වූ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අප විසින් සියළු ආයතනික සහ නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | අදාල නිලධාරින්ගෙන් හිඟහිටි ණය ශේෂ අයකරගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 2.4 වංචනික ස්වරූපයේ ගනුදෙනු

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මහරගම ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ උඩහමුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම තුළ 2014 සිට 2018 වසර දක්වා වූ කාලය තුළදී මියගිය වැඩිහිටියන් පස් දෙනෙකුගේ රු.330,200 ක වැඩිහිටි ජීවනාධාර මුදලක් ඔවුන් මිය ගිය පසුවද අවිධිමත් ලෙස ගෙවා තිබුණි. නමුත් එසේ ගෙවන ලද මුදල් අය කර ගැනීමට හෝ එම ගෙවීමට අදාළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියා මාර්ග ගැනීමට 2021 මැයි මාසය වන තුරුද නොහැකි වී තිබුණි. | පවත්වන ලද විමර්ශනයකට අනුව මියගිය ප්‍රතිලාභීන් 05 දෙනෙකුගේ වැඩිහිටි ජීවනාධාර, ඔවුන් මියගිය පසුද ගොවා ඇති බව අනාවරනය කර ගෙන මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිය දෙපාර්තමේන්තු මට්ටමින් සිදු කර, අයවියයුතු රු.330,200ක මුදල ප්‍රාදේශීය ලේකම්, මහරගම නමින් ගෙවීමට කටයුතු කරන ලෙසත් ඊට වගකිවයුතු නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් මාගේ අංක DIST.CMB/ACC06/GEN/01/2020 හා 2020 සැප්තැම්බර් 28 දාතමින් ලිපියක් තැපැල්පති වෙත යොමු කරන ලදි. ඊට ප්‍රතිචාර වශයෙන්, අදාල විමර්ශණයට අවශ්‍ය තොරතුරු හා ලේඛන සපයන ලෙස දන්වමින් පාලක (විමර්ශන), තැපැල් දෙපාර්තමේන්තුව විසින් අප වෙත 2021 අප්‍රේල් 19 දිනැතිව එවන ලද ලිපිය මගින් ඉල්ලා ඇති තොරතුරු කඩිනමින් තැපැල් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට 2021 මැයි 19 දිනැති ලිපිය මගින් ප්‍රා.ලේ.-මහරගම | වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන එම නිලධාරීන්ට එරෙහිව කටයුතු ක්‍රියාත්මක කිරීමට හා ආයතනයට සිදුවූ මූල්‍ය පාඩුව පූර්ණය කර ගැනීමට කටයුතු කිරීම කඩිනම් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | වෙත මා විසින් දන්වන ලද බව | |
| (ආ) | ගණනය කිරීමේ හා පරිවර්තනය කිරීමේ දෝෂ, විශ්‍රාම වැටුප් දෙවරක් ගෙවීම, විශ්‍රාමිකයන් මියගිය පසු ඒ බව තහවුරු කර ගැනීමෙන් තොරව තවදුරටත් විශ්‍රාම වැටුප් ගෙවීම, හමුදා විශ්‍රාම වැටුප් සඳහා දෙවරක් ජීවන වියදම් දීමනා ගෙවීම යනාදී විවිධ හේතූන් මත කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 13 ට අදාළ බල ප්‍රදේශයන්හි විශ්රාමිකයන්ට අවිධිමත් හා අක්‍රමිකතා සහිතව විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාමිකයන් 198 දෙනෙකුගෙන් එලෙස වැඩියෙන් ගෙවන ලද නමුත් තවදුරටත් අය විය යුතුව පවතින විශ්‍රාම වැටුප් වටිනාකම රු.23,958,120 ක් වූ අතර එම මුදලින් රු.22,347,228 ක් වර්ෂ 05 කට අඩු කාලයක් හා රු.1,610,892 ක් වර්ෂ 5-10 ත් අතර කාලයක සිට අයවිය යුතුව පැවතුණි. | 2020 ජනවාරි 01 දිනට ශේෂය රු.24,676,638.77 ක්ද 2020 ජනවාරි 01 දින සිට 2020 දෙසැම්බර් 31 දක්වා වාර්තා වූ වැඩිපුර ගෙවීම් ප්‍රමාණය රු.11,605,983.06 ක් හා එම කාලය තුලදී අයකර ගත් මුදල රු.12,324,501.12 ක් වුයෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු ශේෂය රු.23,958,120.71 ක් වේ. වර්ෂය ආරම්භයේදී පවතින ශේෂයෙන් යම් ප්‍රමාණයක් අයකරගනු ලබන අතරම, එම ශේෂයට වැඩිපුර ගෙවීම්, වර්ෂය තුලදී එකතුවෙමින් ඉදිරියට ගමන් කරනු ලබයි. මෙම තත්ත්වයට විශ්‍රාම වැටුප් සංශෝධන, වෛද්‍ය හේතු මත පෙර දාතම් කරමින් විශ්‍රාම ගැන්වීම හා වයස අවු.55 දක්වා වැටුප් ගෙවීම වැනි ත්‍රිවිධ හමුදා ක්‍රියාවලීන් තුල විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් සිදුවීම, විශ්‍රාමිකයින් මියගිය දිනය හා එය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වාර්තාවන දිනය අතර සිදුවන වැඩිපුර ගෙවීම් (බොහෝ විට ATM යන්ත්‍ර මගින් ඥාතීන් මුදල් ලබා ගැනීම), ජීවන වියදම් වැඩිපුර ගෙවීම් වාර්තා වීම. (විශේෂයෙන් හමුදා දුබලතා හා යැපීම් දීමනා වලදී), වැටුප් පරිවර්තන හා වැටුප් විෂමතා ගණනයේදී සිදුවන දෝෂ, විශ්‍රාමිකයින් වෙත, ඒකාබද්ධ නොකර වැටුප් ගෙවීම් සිදුවීම මෙයට හේතු වී ඇති බව.<br>එමෙන්ම විශ්‍රාමිකයින් මියයාම, තාවකාලිකව වැටුප් නතර කිරීම සහ ඥාතීන් මුදල් ගෙවීම් පැහැර හැරීම් යන කරුණු මත, නැවත අයකර ගත නොහැකි මුදල් ප්‍රමාණයන්ද ඉහත ශේෂයන් තුල ඇතුලත්ව ඇති බව.<br>මෙම වැඩිපුර ගෙවීම් අවම කර ගැනීම සම්බන්ධයෙන් ගතහැකි පිළියම් පිලිබඳව මෙන්ම බොහෝ ප්‍රා.ලේ.කාර්යාලවල ගණකාධිකාරී යටතේම, විශ්‍රාම වැටුප් අංශයද පවතින අතර ඔවුන්ගේ රාජකාරී වපසරිය තුල විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම අපහසු හෙයින් විශ්‍රාම වැටුප් සඳහා වෙනම ගණකාධිකාරීවරයෙකු පත් | විශ්‍රාම වැටුප් නිවැරදි හා විධිමත් ලෙස සකසා ඒවා පරීක්ෂා කිරීමෙන් අනතුරුව විශ්‍රාම වැටුප් ගෙවීමටත් විශ්‍රාමිකයන් සම්බන්ධයෙන් ජීවතුන් අතර සිටින විශ්‍රාමිකයන් වෙනුවෙන් පමණක් විශ්‍රාම වැටුප් ගෙවීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| | කිරීම වැනි කරුණු සඳහන් කරමින් අවස්ථා කිහිපයකදීම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව මෙන්ම වාචිකවද ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව එමෙන්ම මේ සම්බන්ධයෙන්, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී නිරන්තරයෙන් සාකච්ඡාවට භාජනය කරනු ලබන අතර විශ්‍රාම වැටුප් නිලධාරීන්, ගණකාධිකාරීවරුන් මෙන්ම දැනට සිටින අවම පුහුණු නිලධාරීන් යොදවා ගෙන මෙම තත්වයන් අවම කර ගැනීම අප විසින් නිරන්තරයෙන් කටයුතු කරන බව. | |

**2.5 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 මුල්‍ය ප්‍රකාශනවල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වෙනත් අමාත්‍යාංශ වියදම් වාර්තාව අනුව වැය විෂයය විස්තර 104-2-6-6-2506 හා 102-2-7-6-2506 යටතේ පිළිවෙලින් රු.300,744,525 ක් හා රු.617,343,000 ක් වශයෙන් එකතුව රු.918,087,525 ක් වියදම් ගිණුම්ගත කර තිබුණි. මෙය සපිරි ගමක් වැඩසටහන ඇතුළත්ව ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහනට අදාලවය.<br>සපිරි ගමක් වැඩසටහන යටතේ අනුමත ව්‍යාපෘති 1173 ක් සඳහා අනුමත ප්‍රතිපාදනය රු.මිලියන 1052 ක් විය. 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තා අනුව එම ව්‍යාපෘති වෙනුවෙන් වැයකළ මුදල රු.මිලියන 589ක් හා අතැති බිල්පත් රු.මිලියන 408.8 ක් විය.<br>ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ අනුමත ව්‍යාපෘති 209 ක් වෙනුවෙන් අනුමත ප්‍රතිපාදනය රු.මිලියන 137ක් විය. එම ව්‍යාපෘති වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 වනවිට ප්‍රගති වාර්තා අනුව | සපිරි ගමක් වැඩසටහන සඳහා, 2020 වර්ෂය තුළ වෙන් කරන ලද මුදල රු.මිලි.1051.71ක් වුවත් ඉන් අනුමත කර තිබුනේ ඊට අඩු මුදලක් වන අතර එම අනුමත වූ ව්‍යාපෘතිවලින්ද 2020 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති 1173ක් වෙනුවෙන් රු.මිලි.588.96ක ප්‍රතිපාදන මුදලක් අප වෙත ලබා දෙන ලදී. එම සියළු ව්‍යාපෘති සඳහා 2020 දෙසැම්බර් 31 දිනය වන විට ගෙවීම් අවසන් කර ඇති බව<br><br>මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අංක **MFEPD/PLAN/RD** 2020 හා 2020 ජනවාරි 28 දාතම ලිපිය පරිදි, අදාල ව්‍යාපෘති අවසන් කර එම ව්‍යාපෘති මෙහෙයුම් හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්තා කිරීමෙන් අනතුරුව අදාල ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන නිදහස් කරන බවද මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ ඉහත ලිපියෙහි උපදෙස් මත ක්‍රියාකිරීම සුදුසු බව විගණන හා කළමනාකරණ කමිටු | අනුමත සංවර්ධන වැඩසටහනට අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කර එහි ගෙවීම් කටයුතුද සමාලෝචිත වර්ෂය තුළදීම නිමකිරිමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| රු.මිලියන 121ක වියදමක් හා අතැති බිල්පත් රු.මිලියන 0.59 ක් නිරීක්ෂණය වූ අතර ව්‍යාපෘති 10 ක් ඇස්තමේන්තු සකස්කරන අධියරේ පැවතුණි.<br><br>රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2020 හි 3.5 ඡේදය අනුව 2020 වර්ෂය තුළ යම් අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් විසින් වෙනත් රජයේ හෝ පෞද්ගලික ආයතනයකින් භාණ්ඩ හා සේවා ලබාගෙන ඇත්නම් ඊට අදාළ බිල්පත් 2020 දෙසැම්බර් 31 වන දින හෝ ඊට පෙර පියවා ගිණුම්ගත කිරීමට පියවර ගත යුතු වුවද, ඉහත සංවර්ධන වැඩසටහන්වලට අදාලව රු. මිලියන 409.39ක් වටිනා අතැති බිල්පත් පැවතුණි. | රැස්වීමේදීද තීරණය වූ බව. ඒ අනුව ව්‍යාපෘති අවසන් වුවද 2020 දෙසැම්බර් 31 දක්වාම ප්‍රතිපාදන නොලද වටිනාකම අප විසින් අතැති බිල්පත් ලෙස දක්වා ඇති බව | |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **සැලැසුම් කිරීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රධානීන් විසින් තම ආයතනය වෙනුවෙන් අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා තුන් අවුරුදු මධ්‍යකාලීන අයවැය රාමුව තුළ මුදල් වර්ෂයට අදාළ අන්තර්ගත විය යුතු සියළු කරුණු හා අවශ්‍යතාවයන් ඇතුළත් කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වුවත්, අදාල සියළු කරුණු ඇතුළත් කර විධිමත් ලෙස වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විධිමත් ලෙස වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර, එය පාලන කාරකයක් ලෙස යොදාගෙන අරමුණු සාක්ෂාත් කර ගැනිම වෙනුවෙන් වූ කාර්යභාරය ඉටු කිරිමට පියවර ගත යුතු වීම. |

**3.2** **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ආයතනයේ අංශ 31 කට අදාලව හදුනාගත් කාර්යසාධන දර්ශකයන් 154 ක නිමවුම් ප්‍රගතිය සඳහන් කර තිබුණි. එයින් කාර්යසාධන දර්ශක 33 ක නිමවුම් ප්‍රගතිය සියයට 75කට වඩා අඩුවිය. | අදහස් දක්වා නැත. | අපේක්ෂිත නිමවුම් මට්ටම ලගාකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**3.3** **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශය සමග ඉදිරිපත් කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත, මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | පවතින කොරෝනා වසංගත තත්වය පිළිබදව ප්‍රමුඛ අවධානයකින් කටයුතු කිරීමට සිදුවීම නිසා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත ඉදිරිපත් කිරීමට ප්‍රමාදවී ඇති බවද මේ වන විට තෛයිභාෂා කාර්යසාධන වාර්තාව සකස් කර අවසන් වෙමින් පවතින අතර එය භාරදීමට හැකි බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3.4** **පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දින වන විට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගිනි ගැනීමෙන් සිදු වූ හානියට වර්ෂ 08 ක් සහ මහරගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ගිනි ගැනීමෙන් සිදු වූ හානියට වර්ෂ 05 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගිනි ගැනීමට අදාල පොලිස් විමර්ශන තවමත් අවසන්ව නොමැති නිසා ගොනුවේ | පාඩු හා හානි පිළිබඳව පරීක්ෂණ කඩිනමින් පවත්වා ඊට වගකිව යුතු නිලධාරීන්ට හා සේවකයන්ට එරෙහිව කටයුතු කිරීමට හා රජයට සිදුවූ පාඩුව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා |

| | | |
|---|---|---|
| කට අධික කාලයක් ඉකුත් වී තිබුණි. නමුත් එම හානිවලින් අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණු පාඩු හා හානි වටිනාකම පිළිවෙලින් රු.92,606,688 ක් සහ රු.629,492 ක් වශයෙන් එකතුව රු.93,231,180 ක් විය. වර්ෂ 08 ක් ගත වන තුරුත් මේ සම්බන්ධයෙන් පොලිස් විමර්ශණ අවසන් වී නොතිබුණු බැවින් එම හානි අයකර ගැනිම හෝ කපාහැරීම සිදුකළ නොහැකිව පැවතුණි. | කටයුතු අවසන් කිරීමට උපදෙස් විමසා 2021 ජනවාරි 15 දාතමින් මා විසින් ලිපියක් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව. | ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 101 හා 156 රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව ඊට වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් පූර්ණය කර ගැනීමට හා අනතුරුව හානි නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.5 කළමනාකරණ දූර්වලතා**

**---------------------------**

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | **--------------------** | **--------------------------** | **------------** |
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීමට ප්‍රථම ප්‍රාදේශීය ලේකම් බල කොට්ඨාශයට ගැනෙන වසම් හා සීමාවන් නිර්ණය කොට ත්‍රෛභාෂාවෙන් ගැසට් පත්‍රයේ පළකළ යුතු විය. එහෙත් පිළිවෙලින් 1999 මාර්තු 03 දින සහ 1999 මැයි 19 දින ආරම්භ කර ඇති තිඹිරිගස්යාය සහ පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙනුවෙන් අදාළ සීමාවන් නිර්ණය කොට කොට්ඨාශ ස්ථාපිත කිරීමේ ගැසට් නිවේදන 2021 මැයි 31 දින වන තුරුම ප්‍රකාශයට පත්කර නොතිබුණි. | දැනට පරිපාලන සීමා ගැසට් නොකළ සියළු ප්‍රා.ලේ. කාර්යාල ගැසට් කිරීම සම්බන්ධයෙන් මාගේ අංක **DIST.CMB/AD/**06/01/14 හා 2021 මැයි 08 දිනැති ලිපියට අනුව පාදුක්ක සහ තිඹිරිගස්යාය ප්‍රා.ලේ.කාර්යාල ගැසට් කිරීමට අදාල තෛයිභාෂා ගැසට් පෝරම මේ වන විට ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ස්ථාපිත කිරීමට ප්‍රථම එම ලේකම් බල කොට්ඨාශවලට ගැනෙන වසම් හා සීමාවන් නිර්ණය කොට ත්‍රෛභාෂාවෙන් ගැසට් පත්‍රයේ පළකළ යුතු වීම. |
| (ආ) | මහරගම නගර සංවර්ධනය සඳහා ඉඩම් අත්කර ගැනීම යටතේ ගමනාගමන මණ්ඩලයට අයත් ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය පවරාගෙන තිබුණද, 2016 පෙබරවාරි 02 දිනැති තක්සේරු දෙපාර්තමේන්තුවේ වන්දි මුදල් තක්සේරු වටිනාකම වන රු.මිලියන 112 ක් ගමනාගමන මණ්ඩලයට ගෙවා නොතිබුණි. | මේ සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ගෙවිය යුතු රු.මිලි.112ක මුදල් ප්‍රතිපාදනය මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලා ඇති අතර, එය ලද පසු ගෙවීම් කිරීමට කටයුතු කරන බව. | අදාළ ප්‍රතිපාදන ලබාගෙන වන්දි මුදල ගෙවීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වසර කිහිපයකට පෙර මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ඉදි කර ඇති මහල් 06 කින් යුක්ත නව ගොඩනැගිල්ල සඳහා විදුලි සෝපාන 04 ක් ඉදිකළ යුතුව ඇතත්, 2021 මැයි 31 දින වන විටත් එම විදුලි සෝපාන ඉදිකර නොතිබුණි. | 2021 මූල්‍ය ප්‍රතිපාදන යටතේ මේ සඳහා මුදල් වෙන් කර ඇති අතර එය ප්‍රා.ලේ. මහරගම වෙත 2021 මාර්තු 16 දින ලබාදීමට කටයුතු කර ඇත. මෙය දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව මගින් සිදු කළ යුතු ප්‍රසම්පාදනයක් බැවින් ඒ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ඉංජිනේරු අංශය මගින් මේ වන විට කටයුතු කරමින් සිටින බව. | අදාළ විදුලි සෝපාන කඩිනමින් ඉදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතු වීම. |
| (ඇ) | කොළඹ, දෙහිවල, කොලොන්නාව, කැස්බෑව සහ හෝමාගම යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල පවත්වාගෙන යනු ලබන ඉඩම්වල අයිතිය එම ප්‍රාදේශිය ලේකම් කාර්යාල සතු නොවූ අතර ඒවායේ අයිතිය පවරා ගැනීම සඳහා මේ වන තෙක් විධිමත් පියවර ගෙන නොතිබුණි. අයිතිය ප්‍රාදේශිය ලේකම් කාර්යාල සතු නොවූ මෙම ඉඩම්වල ඉදිකිරීම් කටයුතු සඳහා එම ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් රජයේ මුදල් විශාල වශයෙන් වැය කර තිබුණි. | කොළඹ ප්‍රා.ලේ. කාර්යාල ඉඩම - මැනුම් නියෝගයක් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කිරීමටද, දෙහිවල ප්‍රා.ලේ.කාර්යාල ඉඩම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ඉංජිනේරු අංශය විසින් ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බවද, කොලොන්නාව ප්‍රා.ලේ. කාර්යාල ඉඩම සඳහා මුල් ගොණුවක් නොමැති හෙයින් අලුතින් ගොණුවක් ආරම්භ කර ඉඩම පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා කොලොන්නාව ප්‍රා.ලේකම් කටයුතු කරන බවද කැස්බෑව හා හෝමාගම ප්‍රා.ලේ.කාර්යාල ඉඩම රජය සතු බැවින් ඒ අනුව අදාල ඉදිකිරීම් සිදු කර ඇති බව<br>තවද, දැනට වසරක පමණ කාලයක සිට පවතින කොවිඩ් වසංගත තත්වය නිසා, ඒ සම්බන්ධයෙන් ප්‍රමුඛතාවයකින් යුතුව කටයුතු කිරීමට ප්‍රා.ලේ.කාර්යාල වලට අපහසුවීම නිසා මෙන්ම ඉඩම් පවරා ගැනීමේ කටයුතු සඳහා වෙනත් දෙපාර්තමේන්තු සහය ලබා ගැනීමට, පවතින තත්වය හමුවේ ඇති අපහසුතාවය නිසා ඉඩම් පවරා ගැනීමේ කටයුතු යම් මන්දගාමී මට්ටමක පවතින නමුත් හැකි ඉක්මනින් | ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටි ඉඩම්වල නෛතික අයිතිය පවරා ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | මේ සම්බන්ධයෙන් කටයුතු කරන ලෙස අදාල ප්‍රා.ලේකම්වරුන් වෙත උපදෙස් දුන් බව. | |
| (ඉ) | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප්වලට අදාළ පැරණි ලිපි ගොනු 337ක් අස්ථානගතවී ඇති බව විගණනයට නිරීක්ෂණය වූ අතර මෙම ගොනු තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ හෝ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුළද නොමැති බව දක්නට ලැබුණි. නමුත් එම විශ්‍රාමිකයන්ට අදාළ තාවකාලික ලිපිගොනු නැවත සකස් කිරිම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 මැයි 31 දින දක්වාම විධිමත් සහ ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නැවතත් ලේඛනාගාරය පරීක්ෂා කර බලා ගොනු 6 ක් සොයා ගත් බවද, ගොනු නොමැති විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් තාවකාලික ලිපි ගොනු සකස් කිරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන ගෙන්වා ගෙන විධිමත් පරිදි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඒ සඳහා අනුමතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | අස්ථානගතවූ විශ්‍රාම වැටුප්වලට අදාළ පැරණි ලිපි ගොනු සොයාගැනීමට හෝ තාවකාලික ලිපිගොනු නැවත සකස් කිරිමට විධිමත් සහ ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතු අතර ලිපිගොනුවල ආරක්ෂාව හා පැවත්ම තහවුරු කෙරෙන පාලන ක්‍රමවේදයන් හඳුන්වා දිය යුතු වීම. |
| (ඊ) | 2016 ජුනි 21 දිනැති අංක CO/PDK/2010/679 දරන අනුරේඛණය සකස් කර ඇති පාදුක්ක ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ මිනිමරු දොළ රක්ෂිතයේ, රජයේ ඉඩම් ආඥා පනතේ ඉඩම් නියෝග 228 අනුව දොළ රක්ෂිතය වෙනමද, පුද්ගලයන් පදිංචි හා භුක්ති විඳින කොටස් වෙනමද, දැක්වෙන අනුරේඛණයන් සැකසීම සඳහා 2016/26 මැනුම් ඉල්ලීම මිනුම් අධිකාරී (කොළඹ) වෙත යොමු කර තිබුණි. නමුත් අදාල මිනුම් ඉල්ලීම සඳහා 2019 මාර්තු 23, 2020 මාර්තු 13 හා 2020 දෙසැම්බර් 02 දින සිහි කැඳවීම් ලිපි යොමුකර ඇතත් මෙතෙක් එම අනුරේඛණ සැකසීමේ කටයුතු සිදු කර නොතිබුණි. | රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් පැමිණ, මැනුම් කටයුතු සිදු කිරීමෙන් අනතුරුව අනෙකුත් ක්‍රියා මාර්ග ගතයුතු හෙයින් මෙම කටයුතු මන්දගාමී වී ඇති බවද මේ සම්බන්ධයෙන් ඍජු මැදිහත්වීමකින් යුතුව ඉදිරි කටයුතු සිදුකරන ලෙස ප්‍රාදේශීය ලේකම්-පාදුක්කට උපදෙස් දෙන ලද බව | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ප්‍රමාණවත් පරිදි ලිපි ඉදිරිපත් කර ඇති නමුත් අදාළ කාර්යය සිදු වී නොමැති බැවින් දිස්ත්‍රික් ලේකම්වරයාගේ ඍජු මැදිහත් වීමෙන් මිනුම්පතිවරයා දැනුම්වත් කර අදාළ කාර්යයන් ඉටු කරවා ගත යුතු වීම. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගෙන තිබුණු බවට 2020 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවේ තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය යටතේ අංශ 30 කට අදාලව තිරසාර සංවර්ධන අරමුණු 69 ක් යටතේ දර්ශක 106ක ප්‍රගතිය දක්වා තිබුණු අතර එයින් දර්ශක 15ක ප්‍රගතිය සියයට 50කට වඩා අඩුව පැවතුණි. | අදහස් දක්වා නොමැත. | තිරසර සංවර්ධනය උදෙසා අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනුමත සේවක සංඛ්‍යාව 1,424 ක් ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 1,214 ක් ද, වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 210 ක් හෙවත් අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 15 ක් විය. සංවර්ධන නිලධාරී තනතුරු පුරප්පාඩු 10 ක්ද, රාජ්‍ය කළමනාකරණ සේවයේ තනතුරු පුරප්පාඩු 72 ක්ද, ග්‍රාම නිලධාරී තනතුරු පුරප්පාඩු 71ක් ද, මේ අතර විය. මෙම තනතුරුවල පුරප්පාඩු පැවතීම මහජනතාවට සපයන සේවාවන්හි කාර්යක්ෂමතාවයට හා ඵලදායීතාවයට අහිතකර ලෙස බලපෑ හැකි බවක් නිරීක්ෂණය විය. | මාසික සේවක සංඛ්‍යා වාර්තා මගින් සියළු කාර්යාලවල පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කරන අතර නවක සේවකයින් අනුයුක්ත කිරීම අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බවද දැනට කාර්යාලවලට අනුයුක්ත කර ඇති, නවක අභ්‍යාසලාභී උපාධිධාරී නිලධාරීන් යොදවා අඛණ්ඩ, කාර්යක්ෂම සේවයක් මහජනතාව වෙත ලබාදීමට කටයුතු කරන බව. | පවතින කාර්ය මණ්ඩලය, අඛණ්ඩව කාර්යක්ෂම සේවයක් ලබාදීමට ප්‍රමාණවත් නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරිමටද, නැතහොත් අදාල පුරප්පාඩු පිරවීමටද කටයුතු කළ යුතු වීම. |